**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

## <u>භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම</u>

**2026 මැයි 06 වැනි දින රුපියල් මිලියන 100,000 ක් වටිනා**
**භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ වෙන්දේසිය**

භාණ්ඩාගාර බිල්පත් නිකුතුව පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| පරිණත කාලය | **දින 91** | **දින 182** | **දින 364** | **එකතුව** |
|---|---|---|---|---|
| සු.හ.ජා. අංකය (ISIN)* | LKA09126H072 | LKA18226K065 | LKA36427E078 | |
| වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ මුදල (රු.මිලි.) | 45,000 | 25,000 | 30,000 | 100,000 |

| | |
|---|---|
| වෙන්දේසි කරන දිනය | : 2026 **මැයි 06** වැනි දින |
| ගෙවීම් කළ යුතු දිනය | : 2026 **මැයි 08** වැනි දින |
| නිකුතුවේ දිනය | : 2026 **මැයි 08** වැනි දින |
| ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව | : 2026 **මැයි 06** වැනි බදාදා පෙ.ව. 11.00 |
| ලංසුවක් සඳහා අවම මුදල | : රුපියල් මිලියන පහක් (රු. 5,000,000/-) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (රු. 1,000,000/-) ගුණිතයන්ගෙනි. |

රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මගින් පමණකි. ඉහත සඳහන් පරිදි ලංසුවක් සඳහා වන අවම මුදලට අනුගත වෙමින් අපේක්ෂිත ආයෝජකයන්ට (මහජනතාව හෝ වෙනත් ඕනෑම ආයෝජකයෙකුට) පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන් හරහා ලංසු ඉදිරිපත් කළ හැකිය.

**ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ලැයිස්තුව**

| | | | |
|---|---|---|---|
| ලංකා බැංකුව | 2541938 | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී. | 2639883 |
| කැපිටල් එලයන්ස් පී.එල්.සී. | 2317777 | මහජන බැංකුව | 2206783 |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. | 2332319 | සම්පත් බැන්ක් පී.එල්.සී. | 2305842 |
| එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 2425010 | සෙලාන් බැන්ක් පී.එල්.සී. | 2456340 |
| එච්.එන්.බී සෙකියුරිටීස් ලිමිටඩ් | 2206297 | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් | 2675096 |

වෙළෙඳපොල තත්ත්වයන් මත, මෙම වෙන්දේසියට ඉදිරිපත් කරන ලද සම්පූර්ණ ප්‍රමාණය ඉක්මවා නොයන පරිදි, එක් එක් පරිණත කාලයන්ට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රමාණයන්ට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණයන් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් පිළිගනු ලැබිය හැකි ය.

අපේක්ෂිත ආයෝජකයන්ට ප්‍රාථමික අලෙවිකරුවන් හෝ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ද්විතියික වෙළඳ පොළෙන්ද භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත හැකිය.

* සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය

<u>**නිකුත් කරන කාර්යාලය**</u>
රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
ලේකම් කාර්යාලය, කොළඹ 1.
දුරකථන : +94 112 484 604
www.treasury.gov.lk

උදේනි උඩුගහපත්තුව
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය